සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
පස්වැනි කලාපය, ප්‍රථම භාගය, 2010 ජනවාරි , 111-132
ISSN 1800-1459

# කුඩා වැව් ගම්මානවල සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි වැව් ප්‍රතිසංස්කරණයේ බලපෑම් (ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙනි)

**කේ. පී. එල්. නිශාන්ත පටබැඳි**

*සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ. පෙ. 02, බෙලිහුල්ඔය.*

## සාරාංශය

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක තත්වයේ කුඩා වැව් 20,000 ක් පමණ දක්නට ලැබේ. විවිධ මානව අවශ්‍යතා රාශියක් සඳහා කුඩා වැව යොදා ගැනේ. කුඩා වැව් 250 කින් සමන්විත ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිසංස්කරණය කළ වැව් 77 ක් ඇසුරෙන් මෙම අධ්‍යයනය සිදුකර ඇත. ග්‍රාමීය සංවර්ධන උපාය මාර්ගයක් වශයෙන් කුඩා වැව් ප්‍රතිසංස්කරණය ප්‍රතිඵලදායක වේ ද යන්න සොයා බැලීම අරමුණු අතර විය. පවුල් 150 ක නියැදියක් ආශ්‍රයෙන් ප්‍රශ්නාවලි සමීක්ෂණයක් මගින් ද ගොවි සංගම් 12 ක් ආශ්‍රයෙන් කළ PRA (පී. ආර්. ඒ.) සමීක්ෂණයක් මගින් ද දත්ත ලබා ගැනීම සිදුකර කර ඇත. දත්ත සංඛ්‍යාන විද්‍යාත්මක ව විශ්ලේෂණය කර තිබේ. නියැදියේ ප්‍රජාව අතරින් 100 % ක්ම වැව ප්‍රතිසංස්කරණයට පෙර සහ පසුවත් වී වගාවේ නියැලී ඇත. උස් බිම් වගා කටයුතුවල නියැලී සිටි ගොවි ප්‍රතිශතය ප්‍රතිසංස්කරණයෙන් පසු අඩුවී ඇත. ධීවර කටයුතු සඳහා වැව භාවිත කළ සංඛ්‍යාව වැව ප්‍රතිසංස්කරණයෙන් පසුව වර්ධනය වී ඇත. මුදල් සෙවීම සඳහා වැවතුළ පිපෙන මල් විකිණීම හා නෙළුම් අල ගලවා විකිණීමෙහි යෙදුණු සංඛ්‍යාව ප්‍රතිසංස්කරණයෙන් පසුව අඩුවීමක් දක්නට ලැබේ. සමස්තයක් වශයෙන් මාසික ආදායම්වල ද එදිනෙදා අවශ්‍යතා සඳහා දරනු ලැබූ වියදම්වල ද ප්‍රතිශතයන් ධනාත්මක ව වර්ධනය වී තිබේ. උස්බිම් වගාවෙන් ලබන ආදායම ද ප්‍රතිසංස්කරණයෙන් පසුව වැඩි වී ඇත. කුඩා වැව් ආශ්‍රිත ධීවර කටයුතු සිදුවන්නේ අවිධිමත් ආකාරයට ය. නමුත් මෑත කාලීන ව ධන ප්‍රවණතාවක් ඇත. කල්පිත පරීක්ෂාවට අනුව ද ඉහත තොරතුරු තහවුරු වී ඇත. ප්‍රතිසංස්කරණයෙන් පසුව නිවාසවල ගුණාත්මක තත්වයන්හි වර්ධනයක් සිදුව නැති බවද වැසිකිළි භාවිතයේ සමස්ථය තුළ ගුණාත්මක වෙනසක් සිදු ව නැති බව ද තහවුරු විය. ප්‍රතිසංස්කරණයට පෙර වැවේ භාවිත තීව්‍රතාව අනුව අංක 1 ගෘහස්ථ අවශ්‍යතා සඳහා ද අංක 2 නෙළුම් අල ගලවා ගැනීමට ද අංක 3 වාර්ෂික බෝග වගාව සඳහා ජලය සැපයීමට ද අංක 4 වී වගාවට ජලය සැපයීමටද හිමි ව ඇත. ප්‍රතිසංස්කරණයට පෙර වඩාත් ප්‍රයෝජනවත් වැව වී තිබුණේ මහගල්කඩවල වැව යි. දෙවන ස්ථානය පහළ පුලංචිය වැව විසින් හිමිකර ගෙන තිබුණි. මැදවච්චිය වැවට තුන්වන ස්ථානය හිමිවිය. ප්‍රතිසංස්කරණයට පසුව වැව් භාවිත කිරීමට හැකි වීමේ ශක්‍යතාව අනුව ප්‍රමුඛතාව ලැබී ඇත්තේ සංචාරක කටයුතු සඳහා ය. දෙවන ස්ථානය වී වගාවට ජල සම්පාදනය කිරීම හිමිකරගෙන තිබේ. තුන්වන ස්ථානය ගෘහස්ථ කටයුතු සඳහාත් අටවන ස්ථානය ධීවර කටයුතු සඳහාත් හිමි ව ඇත.

**කේන්ද්‍රීය වචන** කුඩා වැව, ප්‍රතිසංස්කරණය, වැව් ප්‍රජාව, වැව් ආර්ථිකය, සංවර්ධනය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී විශේෂයෙන් වී වගාවේ දී කුඩා වැව් සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දීමට සිදුවේ. ඊට හේතුව වන්නේ ශ්‍රී ලංකාවේ වියලි කලාපය පුරා කුඩා වැව් 30,000 ක් පමණ දක්නට ලැබීමත් (Tennakoon, 2002) වියලි කලාපීය ජන ජීවිතය ඒ වටා හැඩ ගැසී තිබීමත් ය. හුදෙක් වී වගාවට ජලය ලබා ගැනීමට පමණක් නොව් අති විශේෂිත වූ කටයුතු රාශියක් ඉටු කර ගැනීම සඳහා කුඩා වැව යොදා ගැනේ. වැව යනු ගම යන්නත් ගම යනු වැව යන්නත් යන අදහස සත්‍යයක් වන තරමට ගම හා වැව එකිනෙකට බැඳී පවතී. සියවස් හතරකට ආසන්න කාලයක් බටහිර ජාතීන්ගේ ආක්‍රමණවලට නතුව් තිබීම හේතුවෙන් විනාශමුඛයට ගිය කුඩා වැව් නැවත ප්‍රතිසංස්කරණය ඇරඹුණේ 1948 දී නිදහස ලැබීමෙන් අනතුරුව ය. ගත වූ දශක 6ක කාලය තුළ කුඩා වැව් 20000 කට අධික ප්‍රමාණයක් වරින්වර ප්‍රතිසංස්කරණයට ලක් වී ඇත. මෙම අධ්‍යයනය මඟින් උත්සාහ ගෙන ඇත්තේ ගතවූ වසර 15 ක කාලය තුළ ප්‍රතිසංස්කරණයට ලක්වූ කුඩා වැව් ආශ්‍රිත සමාජ ආර්ථික වෙනස්වීම් කවරාකාර ද යන්න සොයා බැලීම යි.

කෘෂිකාර්මික හා නිවාස අවශ්‍යතා ඇතුළු විවිධ වූ මානව අවශ්‍යතා සඳහා ජලය ලබා ගැනීමට මෝසම් වැසි මගින් ලැබෙන ජලය රැස්කර ගන්නා මූලාශ්‍රයක් ලෙස කුඩා වැව් භාවිත කෙරේ. ස්වාභාවික ජල මාර්ග හරහා වේල්ලක් බැඳීම මගින් ජල මාර්ගය අහුරා කුඩා වැව් තනාගෙන ඇත. එපමණක් නොව වැසි ජලය රැස්වන ස්ථාන තව දුරටත් හාරා එම පස්වලින් බැම්ම සකස් කොට තනා ගත් කුඩා වැව් ද ඇත. කෙටිකාලීන සුළුම වගාවන්ට ජලය සපයන කුඩා වැව් දිගුකාලීන හෝ විස්තෘත වගාවන් සඳහා ජලය සැපයීමට යොදා ගැනීම දුෂ්කරය. ඊට හේතුව වන්නේ කාලීන ව ලැබෙන වැසි ජලය රැස්කර ගන්නා මූලාශ්‍රයක් වශයෙන් කුඩා වැව් යොදා ගැනීම යි (අවුසදහාමි, 1999; Tennakoon, 2004; සහ Darmasena, 2004 ).

වාපි තාක්ෂණය ශ්‍රී ලංකාවට පමණක් ආවේණික ක්‍රමයක් නොවේ. ආසියානු රටවල් වන මියන්මාරය, තායිලන්තය, කාම්බෝජය සහ ඉන්දියාව වැනි රටවල ද වැව් තාක්ෂණය දක්නට ඇත (Panabokke etal., 2002). ඉන්දියාවේ තමිල්නාඩු, ආන්ද්‍රප්‍රදේශ හා කර්ණාටක යන ප්‍රාන්තවල වැව් භාවිතයෙන් වී වගාව සඳහා ජල සම්පාදනය සිදුවේ. ෆාමර්ට අනුව (Famer, 1957) ශ්‍රී ලංකාවේ සහ දකුණු ඉන්දියාවේ වාපී කෘෂිකර්මයෙහි සමානතාවන් දක්නට ලැබේ. ඊට හේතුව වන්නේ ප්‍රදේශ දෙකේම දේශගුණික තත්වයන්හි සමානතාවන් දක්නට ලැබීම යි. තමිල්නාඩු ප්‍රාන්තයෙහි වැව් 3900 ක් දක්නට ලැබේ . තමිල්නාඩුවේ ඇති වැව් ද ශ්‍රී ලංකාවේ වැව් ලෙසින් ම අංශ දෙකකට බෙදා දැක්විය හැකි ය. එනම් ක්‍රමවත් වැව් සහ ක්‍රමවත් නොවන වැව් වශයෙනි. ක්‍රමවත් වැව්වලට ප්‍රධාන ගංගා සහ ජලාශ මඟින් ජලය සම්පාදනය කෙරේ. ඊට අමතර ව සිය පෝෂක ප්‍රදේශවලින් ද (Catchment Area) ජලය ලැබේ. නමුත් ක්‍රමානුකූල නොවන වැව් සඳහා ජලය ලැබෙනුයේ එහි පෝෂක ප්‍රදේශයට ලැබෙන වර්ෂා ජලයෙන් පමණි. ශ්‍රී ලංකාවේ ද කුඩා වැව් වැඩි ප්‍රතිශතයක් අයත් වන්නේ ඉහත දෙවන වර්ගයට ය. මක් නිසා ද යත් එම කුඩා වැව් ද පෝෂණය

ලබන්නේ සිය පෝෂක ප්‍රදේශයට ලැබෙන වර්ෂාපතනයත් මතුපිට ගලා යන ජලයත් මගින් වීම යි. ශ්‍රී ලංකාවේ කුඩා වැව් ආශ්‍රිත ව කෙරෙන ගොවිතැනෙහි අස්වැන්න තීරණය වන්නේ වැව් පෝෂක ප්‍රදේශයේ පාංශු ව්‍යුහයේ තෙතමන තත්වයන් අනුව සහ ලැබෙන වර්ෂාපතනයෙහි කාලීන සබඳතාවන් අනුව ය (Somasiri, 1979).

## පර්යේෂණ අරමුණු

### ප්‍රධාන අරමුණ

කුඩා වැව් ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව සිදුවී ඇති සමාජ ආර්ථික වෙනස්වීම් පිළිබඳ ව කරුණු අනාවරණය කිරීම.

### ද්විතියික අරමුණු

ග්‍රාමීය සංවර්ධන උපාය මාර්ගයක් වශයෙන් කුඩා වැව් ප්‍රතිසංස්කරණය ප්‍රතිඵලදායක වේ ද යන්න සොයා බැලීම වඩාත් පලදායී හා ධරනීය ලෙස කුඩා වැව් ප්‍රතිසංස්කරණය සඳහා අත්වැලක් සැපයීම.
ක්‍රමවේදය

### අධ්‍යයන ප්‍රදේශය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරාගෙන ඇත. උක්ත ප්‍රදේශය ශ්‍රී ලංකාවේ වියලි කලාපයට අයත් වන තැනිතලා පහත් බිම් හා රළි බිම් ප්‍රදේශයකි. අඩු වර්ෂාපතනයක් ලැබෙන එමෙන් ම ග්‍රාමීය දිළිඳුකම ඉහළ ප්‍රදේශයක් වන නමුත් ප්‍රදේශය පුරා පැතිරුණු කුඩා වැව් රාශියකින් (කුඩා වැව් 250) සමන්විත ප්‍රදේශයකි. පානබොක්කේට (Panabokke, 2000) අනුව කුරුණෑගල උතුරු ප්‍රදේශයේ වර්ග සැතපුම් 1.5 ක ප්‍රදේශයකට කුඩා වැවක් බැගින් ඇත. එබැවින් මෙවන් එළිදරව්වක් සඳහා සුදුසු ම ප්‍රදේශයක් වශයෙන් ගල්ගමුව හඳුනා ගැනිණ. අධ්‍යයන ප්‍රදේශයේ නිරපේක්ෂ පිහිටීම වන්නේ උතුරු අක්ෂාංශ $7^{0}50$, සහ $8^{0}15$, අතරත් නැගෙනහිර දේශාංශ 79 $^{0}67$, ත් $80^{0}45$, අතර ප්‍රදේශය යි. අධ්‍යයන ප්‍රදේශය කුඩා ගම් 182 කින් ද ග්‍රාම නිලධාරී බල ප්‍රදේශ 62 කින් ද සමන්විත ය.

### දත්ත රැස් කිරීම

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත මෙන් ද්විතියික දත්ත ද එකසේ භාවිත කර ඇත. ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණ අධ්‍යයන සහ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිත කර ඇති අතර ස්තෘත සසම්භාවී ලෙස තෝරාගත් වැව් ගම්මාන දොළහක් තුළ (1,2,3 වගු) ජීවත්වන ගොවි පවුල් සංගහණය අතුරින් සසම්භාවී ලෙස තෝරාගත් ගොවි පවුල් 150 ක් යොදා ගනිමින් සමීක්ෂණය පර්යේෂක විසින් ම සිදුකොට ඇත.

වගුව 1: වැව් නියැදිය තෝරාගත් ආකාරය (I පියවර)

| ගොවීන් සංඛ්‍යාව / පෝෂිත ප්‍රදේශය (අක්කර) | 0 59 | 60 119 | 120 189 | 190 249 | එකතුව |
|---|---|---|---|---|---|
| 0 – 35 | 55 | 3 | 1 | 0 | 59 |
| 36 – 71 | 10 | 3 | 0 | 0 | 13 |
| 72 – 107 | 0 | 3 | 0 | 1 | 04 |
| 108 – 143 | 0 | 1 | 0 | 0 | 01 |
| එකතුව | 65 | 10 | 01 | 01 | 77 |

වගුව 2: වැව් නියැදිය තෝරාගත් ආකාරය(II පියවර)

| ගොවීන් සංඛ්‍යාව / පෝෂිත ප්‍රදේශය (අක්කර) | 0 59 | 60 119 | 120 189 | 190 249 | එකතුව |
|---|---|---|---|---|---|
| 0 – 35 | 55/77 ×12 = 8 | 0 | 0 | 0 | 08 |
| 36 – 71 | 10/77× 12 = 2 | 3/77 × 12 = 1 | 0 | 0 | 03 |
| 72 – 107 | 0 | 3/77 × 12 = 1 | 0 | 0 | 01 |
| 108 – 143 | 0 | 0 | 0 | 0 | 00 |
| එකතුව | 10 | 02 | 00 | 00 | 12 |

වගුව 3: සසම්භාවී වගුව භාවිතයෙන් තෝරා ගත් වැව් සහ නියැදිය ලෙස තෝරා ගත් ගො
පවුල් සංඛ්‍යාව

| සසම්භාවී අංක | වැවේ නම | ගොවි පවුල් සංඛ්‍යාව | වැව මගින් පෝෂිත ප්‍රදේශය (අක්කර) | නියැදිය සඳහා තෝරාගත් ගොවි පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 118 | පහල පුලංචිය වැව | 58 | 08 | 15 |
| 87 | ඉහලගම වැව | 13 | 08 | 3 |
| 41 | පහල කෝන් වැව | 31 | 34 | 8 |
| 05 | ඉහල පළුකැන්ඳැව වැව | 40 | 12 | 10 |
| 11 | ඔට්ටුකුලම වැව | 18 | 18 | 5 |
| 83 | දිවුල්ලෑව වැව | 49 | 30 | 13 |
| 16 | කුරුන්දන්කුලම වැව | 35 | 35 | 9 |
| 10 | මොන්නන්කුලම වැව | 46 | 27 | 12 |
| 02 | පහල පළුකැන්ඳැව වැව | 35 | 35 | 9 |
| 29 | බුල්නෑව වැව | 59 | 54 | 16 |
| 90 | මදවච්චිය වැව | 105 | 71 | 27 |
| 93 | මහගල්කඩවල වැව | 90 | 75 | 23 |
| | එකතුව | 579 | | 150 |

අමතර වශයෙන් සහභාගීත්ව ගැමි පිවිසුම් (PRA) ක්‍රමවේදයන් සහ ඉලක්ක ග කන්ඩායම් සාකච්ඡා දත්ත ඌනපූරණයන් සඳහා භාවිත කර තිබේ. ද්වීතියික දත් ලබා ගැනීම සඳහා රජයේ ප්‍රකාශන, විවිධ රාජ්‍ය නොවන ආයතන ප්‍රකාශන, පුව් පත්, විමර්ශිත සඟරා සහ අන්තර්ජාලය යන මූලාශ්‍රයන් සහ ආයතනයන් යො ගැනිණ.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2010, පස්වැනි කලාපය, ප්‍රථම භාගය පිටු 111-132

# කුඩා වැව් ගම්මානවල ආර්ථික සංවර්ධනය කෙරෙහි වැව් ප්‍රතිසංස්කරණයේ බලපෑම්

ශ්‍රී ලංකාවේ වියලි කලාපීය කුඩා වැව් ගම්මානවල ජනතාව වැඩි ප්‍රතිශතයක් සිය ජීවන වෘත්තිය වශයෙන් කෘෂිකර්මය තෝරාගෙන ඇත. ඒ නිසා ඔවුන්ගේ සියලු ක්‍රියාකාරකම් වැව සමග සහ සම්බන්ධ ව පවතී. වැවේ සිදු කරන ප්‍රතිසංස්කරණ ඔවුන්ගේ ආර්ථික කටයුතු හා සෘජු ව සම්බන්ධ වන්නේ එබැවිනි. රජය හෝ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන හෝ වේවා කුඩා වැවක් ප්‍රතිසංස්කරණය කරනුයේ වැව් ගම්මානවාසීන්ගේ ආර්ථිකය තුළ සුභවාදී වෙනස්වීම් බලාපොරොත්තුවෙනි. ගතවූ වසර 15 තුළ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පවතින කුඩා වැව් ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව සිදුව ඇති ආර්ථික වෙනස්වීම් කවරාකාර ද යන්න මෙතැන් සිට පැහැදිලි කිරීමට අපේක්ෂා කෙරේ.

ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මගින් සසම්භාවී ලෙස තෝරාගත් වැව් ගම්මාන 12 තුළ ජීවත්වන ජනතාව සිය ආර්ථික කටයුතුවල නියැලී ඇති ආකාරය පහත 4 වගුව මගින් දක්වා ඇත.

**වගුව 4: වැව ආශ්‍රිත ව ආර්ථික කටයුතුවල නියැලීම**

| | ප්‍රතිසංස්කරණයට පෙර | | | | ප්‍රතිසංස්කරණයට පසු | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | යෙදේ | | නොයෙදේ | | යෙදේ | | නොයෙදේ | |
| ආර්ථික ක්‍රියාකාරකම | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 1 වී වගාව | 150 | 100 | 0 | 0 | 150 | 100 | 0 | 0 |
| 2 ගොඩබෝග වගාව | 131 | 87 | 19 | 13 | 122 | 81 | 28 | 19 |
| 3 ධීවර කටයුතු | 37 | 25 | 113 | 75 | 50 | 33 | 100 | 67 |
| 4 මල් විකිණීම | 14 | 9 | 136 | 91 | 9 | 6 | 141 | 94 |
| 5 නෙළුම් අල විකිණීම | 9 | 6 | 141 | 94 | 8 | 5 | 142 | 95 |

ඒ අනුව නියැදිය සඳහා තෝරාගත් ප්‍රජාව අතරින් 100 % ක් ම වැව ප්‍රතිසංස්කරණයට පෙර සහ පසුවත් වී වගාවේ නියැලී ඇත. උස් බිම් වගා කටයුතුවල ප්‍රතිසංස්කරණයට පෙර 87 % ක් නියැලී සිටියත් ප්‍රතිසංස්කරණයෙන් පසු එම තත්වට 81 % දක්වා අඩු වී ඇත. ඊට හේතුව වන්නේ වැව් ජලයේ කාර්යක්ෂමතාව මත උස්බිම් වගා ප්‍රදේශ ද වී වගාව සඳහා භාවිත කිරීමට යෙදවීමයි. මෙහ දී උස්බිම් වගාව ලෙස සලකා ඇති දත්ත පරාසය තුළ වී වගා බිම් වෙනත් වාර්ෂික වගාවන් සඳහා භාවිත කළ ගොවීන් ද අන්තර්ගත ය. ඒ අනුව වෙනත් වාර්ෂික බෝග සඳහා තම භූමිය භාවිත කළ 6 % ක් ගොවීන් එම භූමිය වැව ප්‍රතිසංස්කරණයෙන් පසුව වී වගාවට යොදවා ඇති බව තහවුරු කළ හැකි ය.

වැව් ප්‍රතිසංස්කරණයට පෙර 25 % ක් දෙනා ධීවර කටයුතු සඳහා වැව භාවිත කර ඇත. එය ප්‍රතිසංස්කරණයෙන් පසුව 33 % ක් දක්වා වර්ධනය වී ඇත. ඊට ප්‍රධාන හේතුව වන්නේ මැදවච්චිය වැව ප්‍රතිසංස්කරණයෙන් පසුව ධීවර කර්මාන්තය සඳහා ඍජු ව භාවිත කිරීම යි. මත්ස්‍ය පැටවුන් වැවට මුදාහැර ඇති දැඩි කිරීමෙන් (culture based fisharie) අනතුරුව අල්ලා ගැනීම සඳහා වැවට සම්බන්ධ සියලුදෙනා සහභාගි වීම දක්නට ලැබේ.

වැවතුළ පිපෙන මල් විකුණා මුදල් ලබා ගැනීම සුළු වශයෙන් කුඩා වැව් ආශ්‍රිත ව දක්නට ඇත. විශේෂයෙන් පොහොය දිනවල දී වැඩි මල් ප්‍රමාණයක් අළෙවි කර ගත හැකි ය. අනෙකත් දිනවල දී ද මල් රැස් කරන්නන් හරහා අනුරාධපුර පුදබිමට මල් යොමු කිරීමේ විභවතාව ද ඔවුන්ට ඇත. නමුත් වැව් ප්‍රජාව අතරින් මෙ කාර්යය සඳහා යොමු වී ඇත්තේ සුළු පිරිසකි. ප්‍රතිසංස්කරණයට පෙර 9 % ක් මුදල් සෙවීම සඳහා මල් විකිණීම කළත් ප්‍රතිසංස්කරණයෙන් පසුව එය 6 % දක්වා අඩු වී ඇත. ප්‍රතිසංස්කරණය මගින් වැව් මත වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම ද සිදුකරන නිසා මල් පිපීම සීමා වීම මෙම අඩුවීමට බලපා ඇති එක් හේතුවක් ලෙස සඳහන් කළ හැකි ය. වැව්වල පිපෙන මල් විකුණා ජීවත් වන බොහෝ පවුල් වියලි කලාපීය වැව් ආශ්‍රිත ව ජීවත්වන නමුත් ඔවුන් බොහෝවිට වැව් ජනාවාසවල පදිංචි ගොවි ප්‍රජාවට අයත් නොවන බව සඳහන් කළ යුතු අතර එය වැව් ප්‍රජාවේ ආර්ථිකය කෙරෙහි සහ සම්බන්ධ නොවන බව ද සඳහන් කළ යුතු වේ.

කුඩා වැව් සිඳී යන කාල සීමාවල දි නෙළුම් අල ගලවා විකිණීම ද සිදුවේ. ඒ කාර්යය ප්‍රතිසංස්කරණයට පෙර නියැලී ඇත්තේ 6 % ක් පමණක් වන අතර ප්‍රතිසංස්කරණයෙන් පසුව 5 % දක්වා අඩු වී ඇත. ආර්ථික ලාභයක් උදෙසා නොව සිය පරිභෝජනය උදෙසා වැව් ප්‍රජාව අතරින් බොහෝදෙනා වැවෙන් නෙළුම් අල ගලවා ගන්නා බව ක්ෂේත්‍ර චාරිකා මගින් තහවුරු කරගත හැකිවිය. පෙර සඳහන් කළ පරිදි ම කුඩා වැව් ගම්මානවල ආර්ථික ක්‍රියාකාරකම් වැව කේන්ද්‍ර කරගෙන සිදුවන බව දක්නට ලැබේ. එහි දී වැවේ සම්පත් ප්‍රයෝජනයට ගෙන විවිධ ආර්ථික ක්‍රියාකාරකම් සිදුවේ. වී වගාව එහි ප්‍රමුඛතම ක්‍රියාකාරකම යි. ආදායම් ලැබිය හැකි අනෙකුත් ක්‍රියාකාරකම් අතර වාර්ෂික බෝග වගාව ධීවර කර්මාන්තය මල් අළෙවි කිරීම සහ නෙළුම් අල විකිණීම ප්‍රධාන වේ.

## වී වගාව මගින් ලබා ගන්නා ආදායම

වී වගාව ප්‍රධාන වශයෙන් සිදුවන්නේ වැව් ජල සම්පාදනය ප්‍රයොජනයට ගැනීමෙනි. මාස හතරක කාලයක් පමණක් ලැබෙන වර්ෂා ජලය වැවේ රැස්කර තබා ගැනීමෙන් අනතුරුව ක්‍රමානුකූලව වී වගා බිම් වෙත මුදා හැරෙයි. මූලික බිම් සැකසුම් සඳහා බොහෝ කන්නවල දී ප්‍රයෝජනයට ගන්නේ වර්ෂා ජලය යි. පහත 5 වගුව තුළ වී වගාවෙන් ලැබෙන ආදායම් පිළිබඳ ව ගොවීන් දැක්වූ අදහස් අන්තරගත කර ඇත.

වගුව 5: වැව ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම්වල ආදායම් තත්වය

| ක්‍රියා කාරකම | අවස්ථාව | ගොවීන්ගේ ප්‍රතිචාරය* % | | | | | ආදායම් කාණ්ඩවල වෙසෙසි වෙනස්වීම*** |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | |
| වී වගාව | | **1** | **86** | **4** | **9** | **0** | වෙනසක් වී ඇත (P**) |
| | ප්‍රතිසංස්කරණවට පෙර | 75 | 14 | 10 | 0 | 0 | |
| ගොඩ බෝග වගාව | **ප්‍රතිසංස්කරණයට පසු** | **1** | **80** | **1** | **4** | **14** | වෙනසක් වී නැත |
| | ප්‍රතිසංස්කරණවට පෙර | 6 | 7 | 69 | 3 | 15 | |
| ධීවර කටයුතු | **ප්‍රතිසංස්කරණයට පසු** | **0** | **9** | **2** | **11** | **78** | වෙනසක් වී ඇත (P**) |
| | ප්‍රතිසංස්කරණවට පෙර | 15 | 13 | 2 | 1 | 69 | |
| මල් කඩා විකිණීම | **ප්‍රතිසංස්කරණයට පසු** | **1** | **9** | **0** | **0** | **90** | වෙනසක් වී නැත |
| | ප්‍රතිසංස්කරණවට පෙර | 1 | 1 | 1 | 2 | 95 | |
| නෙළුම් අල විකිණීම | **ප්‍රතිසංස්කරණයට පසු** | **1** | **4** | **0** | **1** | **94** | වෙනසක් වී නැත |
| | ප්‍රතිසංස්කරණවට පෙර | 1 | 1 | 2 | 1 | 95 | |

* ගොවීන්ගේ ප්‍රතිචාරය

1 ඉතා සතුටුදායකයි 2 සතුටුදායකයි 3 වෙනසක් නැත 4 අඩු වී ඇත

5 යෙදෙන්නේ නැත

P** = වැඩි වී ඇත N** = අඩු වී ඇත *** 95 % වෙසෙසියා මට්ටම

ඒ අනුව වැව් ප්‍රතිසංස්කරණයට පෙර වී වගාව මගින් ලැබෙන ආදායම ඉතා සතුටුදායක බව කීවේ 1 % ක් පමණක් වුවත් ප්‍රතිසංස්කරණයෙන් පසු ඒ තත්වය 75 % ක් දක්වා වැඩි වී ඇත. ප්‍රතිසංස්කරණයට පෙර ආදායම ඉතා අඩු වී ඇති බව 9 % ක් දෙනා අදහස් දැක්වුවත් ප්‍රතිසංස්කරණයෙන් පසු වී වගාවෙන් ලැබෙන ආදායම ආදායම අඩු වී ඇති බවට අදහස් දැක්වූවෝ සිටියේ නැත. මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ වැව් ප්‍රතිසංස්කරණය මගින් වී වගාව කෙරෙහි ධනාත්මක ප්‍රතිපල ඇති කිරීම නිසා දෙකන්න වගාවට ගොවීන් සමත්වීම හා නිසි වෙලාවට ජල සම්පාදනය මගින් හොඳ අස්වැන්නක් ලැබීම ආදායම් ඉහළ යෑමට ප්‍රමුඛ හේතුවක් වුවත් ආදායම් ඉහළ යෑමට ඊට පරිබාහිර හේතු ද බලපා ඇති බව යි. එනම් 2005/2006 කාලයේ දී දේශීය වෙළඳපොලේ වී මිල ඉහළ යාම යි. වී මිල ඉහළ ගියද විකුණා ගැනීම සඳහා වී නිෂ්පාදනය කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික වටපිටාව හොඳින් ඇති වූයේ වැව් ප්‍රතිසංස්කරණයේ ප්‍රතිපලයක් ලෙස ය. වී විකිණීම මගින් ආදායම් ලැබූ ආකාරය පහත 6 වගුව මගින් දක්වා ඇත.

වගුව 6: වී වගාව මගින් ලබා ගන්නා ආදායම (මාසික ව)

| | ප්‍රතිසංස්කරණයට පෙර | | ප්‍රතිසංස්කරණයට පසු | |
|---|---|---|---|---|
| ආදායම | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
| < 2500 | 57 | 38 | 28 | 19 |
| 2500 5000 | 45 | 30 | 32 | 21 |
| 5000 7500 | 26 | 18 | 46 | 31 |
| 7500 10000 | 8 | 5 | 15 | 10 |
| 10000 < | 14 | 9 | 29 | 19 |
| එකතුව | 150 | 100 | 150 | 100 |

ඒ අනුව වැව ප්‍රතිසංස්කරණයට පෙර රු. 2500 ට අඩු මාසික ආදායමක් ලැබූ ගොවීන් 38 % ක් සිටි අතර ප්‍රතිසංස්කරණයෙන් පසු ඒ තත්වය 19 % දක්වා අඩු වී ඇත. ප්‍රතිසංස්කරණයට පෙර රු. 5000 -7500 ත් අතර මාසික ආදායම් ලැබූ ප්‍රතිශතය 17% ක් වුවත් ප්‍රතිසංස්කරණයට පසු එය 31 % ක් දක්වා වැඩි වී තිබේ. ප්‍රතිසංස්කරණයට පෙර 9 % ක් රුග 10000.00 ට වැඩි මාසික ආදායමක් වී විකිණීම මගින් ලබා ඇති අතර ප්‍රතිසංස්කරණයෙන් පසුව එය 19 % ක් දක්වා ඉහළ ගොස් තිබේ (මෙහි දී මාසික ආදායම ගනන් බලා ඇත්තේ වාර්ෂික ආදායම දොළහෙන් බෙදීමෙනි).

## ගොඩ බෝග වගාව මගින් ලබා ගන්නා ආදායම

ගොඩ බෝග වගාවන් ලෙස මෙහි දී සලකා බලා ඇත්තේ වෙනත් වාර්ෂික බෝග වගාවන් ය. මෙහි දී වී වගා භූමිය ද ඇතැම් අවස්ථාවල දී ඒ සඳහා භාවිත කර තිබේ. මුං, කව්පි, මිරිස්, රටකජු හා බඩ ඉරිඟු වගා කරන ප්‍රධාන වාර්ෂික බෝගයන් ය. වී වගාවට තරම් අධික ජල සම්පාදනයක් වාර්ෂික බෝග සඳහා අවශ්‍ය නොවන බැවින් ගොවිහු ඒ සඳහා පෙළඹී ඇත. නියැදියේ අන්තර්ගත වූ ගොවීන්ගෙන් 21 % ක් උස්බිම් වගාව (වාර්ෂික බෝග) නොකළ අතර උස්බිම් වගාවේ නියැලෙන සියලු ම ගොවිහු වී වගාව ද කරති. වැව් ප්‍රතිසංස්කරණයට පෙර සහ පසුව වාර්ෂික බෝග වගාව පිළිබඳ ව ගොවීන්ගේ අදහස් ආශ්‍රිත දත්ත ඉහත 5 වගුව තුළ දක්වා ඇත.

ඒ අනුව වාර්ෂික බෝගවලින් ලැබෙන ආදායම වැව් ප්‍රතිසංස්කරණයට පෙර ඉතා හොඳ බව පවසන්නේ 1 % ක් පමණක් වුවත් ප්‍රතිසංස්කරණයෙන් පසුව එය 6 % දක්වා වැඩි වී ඇත. එමගින් ලැබූ ආදායම ප්‍රතිසංස්කරණයට පෙර හොඳ බව 80 % ක් දෙනා අදහස් දක්වා ඇති අතර ප්‍රතිසංස්කරණයෙන් පසුව ද වෙනසක් වී නොමැති බව 69% ක් අදහස් කර ඇත. ඒ අනුව පෙනී යන්නේ වැව් ප්‍රතිසංස්කරණය උස්බිම් බෝග වගාව කෙරෙහි බරපතළ බලපෑමක් සිදුකර නොමැති බව යි. එම සියලු දත්ත 95 % වෙසෙසි මට්ටමක් (significant level) යටතේ කල්පිත පරීක්ෂාවට ලක්කළ විට ද මේ බව තහවුරු කළ හැකි විය.

කෙසේ වෙතත් ප්‍රතිසංස්කරණයට පෙර රු. 2500 වැඩි මාසික ආදායමක් ලැබූ ප්‍රතිශතය 8 % ක් වූ අතර ප්‍රතිසංස්කරණයෙන් පසුව එය 36 % ක් දක්වා වැඩිවී තිබේ. රු. 1000 ට අඩු ආදායම් ලැබූ 5 % ක ප්‍රතිශතය ප්‍රතිසංස්කරණයෙන් පසුව 1 % දක්වා පහත බැස ඇත. දේශීය වෙළඳපොලේ භාණ්ඩ මිල ඉහළයාම මෙයට මූලික හේතුව බව පෙනේ (7 වගුව).

**වගුව 7: ගොඩ බෝග වගාව මගින් ලබා ගන්නා ආදායම (මාසික)**

| ආදායම | ප්‍රතිසංස්කරණයට පෙර | | ප්‍රතිසංස්කරණයට පසු | |
|---|---|---|---|---|
| | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
| ගොඩ බෝග වගාව මගින් ආදායම් නොලබන | 20 | 13 | 24 | 16 |
| < 1000 | 8 | 5 | 2 | 1 |
| 1000 1500 | 54 | 36 | 7 | 5 |
| 1500 2000 | 7 | 5 | 20 | 13 |
| 2000 2500 | 48 | 32 | 43 | 29 |
| 2500 < | 12 | 8 | 54 | 36 |
| එකතුව | 150 | 100 | 150 | 100 |

## ධීවර කටයුතු මගින් ලබන ආදායම

කුඩා වැව්වල වාසය කරන මත්ස්‍යයින් ආහාරයට ඉතා සුදුසු මත්ස්‍ය විශේෂ වේ. තිලාපියා, කොරළි, ලුලා ඒ අතර විශේෂිත ය. තිලාපියා සහ කොරළි වර්තමාන කුඩා වැව් මුහුණ දී ඇති ජල දූෂණය ගොඩවීමේ තර්ජනය හා ශාක වැස්ම වර්ධනය වීමට හොඳින් ඔරොත්තු දෙමින් වැව තුළ වාසය කරති. වැව් මාළුවලට දේශීය වෙළඳපොළ තුළ හොඳ ඉල්ලුමක් තිබේ. වෙළඳපොලේ පවතින ඉල්ලුමට මහා පරිමාණ සැපයුම් කරන්නේ විශාල ජලාශ හා විශාල වැව් මගිනි. කුඩා වැව් මගින් එදිනෙදා ග්‍රාමීය ව පවතින ඉල්ලුමට අවශ්‍ය මාළු සපයා ගැනීමක් දක්නට හැකි ය. ගල්ගමුව ප්‍රදේශයේ ඇති කුඩා වැව්වලින් මාළුන් අල්ලා ගැනීම සිදුවන්නේ අවිධිමත් ආකාරයට ය. එමෙන් ම ඉතා සුළු පරිමාණයෙනි. උක්ත වැව් ගම්මානවාසීහු ප්‍රතිපත්තියක් වශයෙන් ධීවර කටයුතුවල යෙදීමට අකමැත්තක් දක්වන්නෝ වෙති. එබැවින් බොහෝවිට වැවේ මත්ස්‍ය සම්පතෙන් ප්‍රයෝජන ගන්නේ පිටස්තර පුද්ගලයෝ ය. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවල දී හමුවූ මාළු අල්ලන්නෝ බොහොමයක් උක්ත වැවට සම්බන්ධ අය නො වෙති. එසේ පිටින් පැමිණෙන පුද්ගලයන් වැවේ මාළු අල්ලා ගැනීම පිළිබඳ ව (බොහෝ විට කරන්නේ බිළීබෑම ය) වැව් ප්‍රජාව විරුද්ධත්වයක් දක්වන්නේ නැත. බොහෝ විට එසේ අල්ලා ගන්නා මාළුන් මිළ දී ගැනීම ඔවුන්ගේ සිරිත යි.

නමුත් මෑත කාලීන ව වැවේ මත්ස්‍ය සම්පත ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රවණතාවක් දක්නට හැකි ය. විශේෂයෙන් අධ්‍යයන නියැදියට ඇතුළත් මදවච්චිය වැව හා

මහගල්කඩවල වැව ආශ්‍රයෙන් ධීවර සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ ධන ප්‍රවණතාවක් ඇත. ඉනුත් මදවච්චිය වැවට උක්ත ගොවි සංවිධානයේ සෘජු මැදිහත්වීම හා අධීක්ෂණය යටතේ මසු පැටවුන් මුදා හැරීම වාර්ෂික ව සිදුකෙරේ. අනතුරුව වැවේ මත්ස්‍ය සම්පත පිටස්තර පුද්ගලයන් විසින් ලබා ගැනීම වලක්වාලීම සඳහා වැව ආරක්ෂා කිරීම ද සිදුවේ. වැවේ ජලය ඉතා පහළ මට්ටමට අඩුවන නියං කාලයේ දී මාළුන් ඇල්ලීම ගොවි සංවිධාන සාමාජිකයන් විසින් ම සිදු කෙරේ. මහා පරිමාණව ලැබෙන මත්ස්‍ය සම්පත විකුණා ආදායම සමාජිකයන් අතර සම ව බෙදා ගන්නා අතර කොටසක් ගොවි සංවිධාන ගිණුමට ද බැර කෙරේ.

නමුත් එවන් විධිමත් ආකාරයට කටයුතු කිරීමක් බොහොමයක් කුඩා වැව් ආශ්‍රිත ව දක්නට ලැබෙන්නේ නැත. නමුත් වැවේ මාළු අල්ලා විකිණීම මගින් යම් ආදායමක් ලබන්නෝ කුඩා වැව් ආශ්‍රිත ව ජීවත් වෙති. ඒ පිළිබඳ ව නියැදියට ඇතුළත් ගොවීන්ගෙන් විමසීමෙන් අනතුරුව සකස්කළ දත්ත පහත 8 වගුව මගින් දක්වා ඇත.

වගුව 8: ධීවර කටයුතු මගින් ලබා ගන්නා ආදායම (මාසික)

| ආදායම | ප්‍රතිසංස්කරණයට පෙර | | ප්‍රතිසංස්කරණයට පසු | |
|---|---|---|---|---|
| | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
| ධීවර කටයුතුවලින් ආදායම් නොලබන | 117 | 78 | 104 | 69 |
| < 500 | 2 | 1 | 0 | 0 |
| 500 1000 | 22 | 15 | 22 | 15 |
| 1000 1500 | 9 | 6 | 15 | 10 |
| 1500 < | 0 | 0 | 9 | 6 |
| එකතුව | 150 | 100 | 150 | 100 |

ඒ අනුව පැහැදිලි වන්නේ අධ්‍යයනයට යොදා ගත් ගොවීන් 150 අතරින් 78 % ක් ම ප්‍රතිසංස්කරණයට පෙර වැවේ ධීවර සම්පත්වලින් කිසියම් හෝ ආදායමක් ලබා නැති බව යි. ප්‍රතිසංස්කරණයෙන් පසුව එසේ ආදායම් නොලබන සංඛ්‍යාව 69 % ක් දක්වා අඩු වී ඇත. 15 % ක් ධීවර සම්පත් මගින් රු. 500 - 1000 ත් අතර මාසික ආදායමක් වැව් ප්‍රතිසංස්කරණයට පෙර ලබාගත් අතර ප්‍රතිසංස්කරණයෙන් පසුව ද එම ආදායම් පරාසය තුළ 15 % ක් සිටිනු දක්නට ඇත. වැව ප්‍රතිසංස්කරණයට පසුව රු. 1500 ඉක්මවූ මාසික ආදායමක් ලැබීමට 6 % ක් සමත් වී ඇත. ධීවර සම්පත් මගින් ලබන ආදායම් පිළිබඳ ව වැව් ප්‍රජාවේ ආකල්පය ඉහත 6 වගුව කෙරෙන් අනාවරණය කර ඇත.

ඉහත 8 වගුව කෙරෙන් පැහැදිලි වන්නේ වැව ප්‍රතිසංස්කරණයට පෙර ධීවර කටයුතු මගින් ලැබූ මාසික ආදායම් තත්වයන්ට වඩා හොඳ ආදායම් තත්වයක් වැව ප්‍රතිසංස්කරණයට පසුව ලබා ගැනීමට හැකියාව ලැබී ඇති බව යි. ආදායම ඉතා හොඳයි යන ස්ථාවරයේ වැව ප්‍රතිසංස්කරණයට පෙර කිසිවකු නොසිටි අතර වැව ප්‍රතිසංස්කරණයට පසුව එම ස්ථාවරයේ සිටින්නන්ගේ ප්‍රතිශතය 15 % ක් වී ඇත. 95 % වෙසෙසි මට්ටමක් යටතේ කල්පිත පරීක්ෂාවට ලක්කල විටද ධීවර කටයුතු මගින් ලබන ආධායම් තත්වයන් වර්ධනයක් ප්‍රතිසංස්කරණයෙන් පසුව දක්නට ඇති බව තහවුරු කළ හැකි විය.

## මල් කඩා විකිණීම මගින් ලබන ආදායම

වැව්වල පිපෙන මල් විකුණා ජීවත් වන බොහෝ පවුල් වියලි කලාපීය වැව් ආශ්‍රිත ව ජීවත්වන නමුත් ඔවුන් බොහෝ විට වැව් ජනාවාසවල පදිංචි ගොවි ප්‍රජාවට අයත් නොවන බව සඳහන් කළ යුතු ය. නමුත් වැවේ පිපෙන මල් විකුණා කිසියම් ආදායමක් මාසික ව ලබන පිරිසක් වැව් ගම්මාවල සිටින බව ඉහත 5 දත්ත වගුව මගින් පැහැදිලි වේ. ඒ අනුව පෙනී යන්නේ වැව් ප්‍රතිසංස්කරණයෙන් පසුව මල් විකිණීමෙන් ආදායම් ලැබීම දුර්වල වී ඇති බවයි. ප්‍රතිසංස්කරණ මගින් වැවේ ශාක වැස්ම ඉවත් කිරීම ඊට හේතුවයි. 95 % වෙසෙසියා මට්ටමක් යටතේ කල්පිත පරීක්ෂාවට ලක්කළ විට ද ප්‍රතිසංස්කරණයෙන් පසුව මල් විකිණීමේ කටයුතු මගින් ලබන ආදායම් තත්වයන්හි වර්ධනයක් සිදු ව නොමැති බව තහවුරු කළ හැකි විය.

## නෙළුම් අල විකිණීම මගින් ලබන ආදායම

කුඩා වැව් සිඳී යන කාල සීමාවල දි නෙළුම් අල ගලවා විකිණීම ද සිදුවන බව මීට පෙර ද සඳහන් කෙරිණ. ඒ කාර්යය ප්‍රතිසංස්කරණයට පෙර නියැලී ඇත්තේ 6 % ක් පමණක් වන අතර ප්‍රතිසංස්කරණයෙන් පසුව 5 % දක්වා අඩු වී ඇති බව ඉහත 5 වගුව විමර්ශනයෙන් පෙනේ. 95 % වෙසෙසියා මට්ටමක් යටතේ කල්පිත පරීක්ෂාවට ලක්කළ විට ද ප්‍රතිසංස්කරණයෙන් පසුව නෙළුම් අල විකිණීමේ කටයුතු මගින් ලබන ආදායම් තත්වයන්හි වර්ධනයක් සිදුව නොමැති බව තහවුරු කළ හැකි විය. කෙසේ වෙතත් වැව සිඳී ගිය විට නෙළුම් අල ගලවා තම ආහාරයට එක්කර ගැනීමෙන් සිය මාසික වියදම පාලනය කර ගන්නෝ කුඩා වැව් ගම්මානවල කොතෙකුත් සිටිති.

කෙසේ වෙතත් වැව් ප්‍රතිසංස්කරණයෙන් පසුව ආදායම් තත්වයන්ගේ ධනාත්මක වෙනසක් සිදු වී ඇති බව පැහැදිලි වුවත් එය වඩාත් තාර්කික අයුරින් සිදු වී තිබේ ද යන ගැටළුව අප හමුවේ පවතී. එසේ වන්නේ කාලයත් සමග සිදුවන මිළ උද්ධමනය හේතුවෙන් මුදලේ වටිනාකම අවප්‍රමාණය වීම යි. එබැවින් ආදායම් වැඩිවීම පළදායී අයුරින් සිදුවී තිබේ ද යන්න තේරුම් ගැනීම සඳහා එක්එක් වියදම් අංශයන්ගේ සිදු වී ඇති වෙනස යොදා ගත හැකි ය. උදාහරණයක් වශයෙන් අඩු ආදායම්ලාභීන් සිය වාර්ෂික ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් යොදවන්නේ ආහාර සඳහා ය. සිය ආදායමෙන් ආහාර සඳහා වෙන් කෙරෙන ප්‍රතිශතය වැව් ප්‍රතිසංස්කරණයෙන් පසු ව අඩු වී තිබේ නම් ඉන් ඇඟවෙන්නේ ආදායම්හි ධනාත්මක වෙනසක් ඇති වී තිබෙන බව යි.

## කුඩා වැව් ප්‍රජාවේ මාසික වියදම

කුඩා වැව් ප්‍රතිසංස්කරණය උක්ත වැව් ප්‍රජාවේ වියදම් රටාවන් කෙරෙහි කෙසේ බලපා තිබේ ද යන්න මෙතැන් සිට සාකච්ඡා කෙරේ. ඒ අනුව වැව ප්‍රතිසංස්කරණයට පෙර වියදම් තත්වයන් හා ප්‍රතිසංස්කරණයෙන් පසුව එම වියදම් රටාවන්වල වෙනස්වීම විග්‍රහ කර ඇත. ප්‍රශ්නාවලි සමීක්ෂණය මත පදනම් ව සකස් කළ 9 වගුව මගින් එම තොරතුරු නිරූපණය කෙරේ.

ඒ අනුව ප්‍රතිසංස්කරණයට පෙර මෙන්ම පසුව ද මාසික ආහාර වියදම රු. 1000 ඉක්මවා ඇත. රු.2000 ට අඩුවෙන් තම ආහාර වියදම සපුරා ගත් 18 % ක් වැව් ප්‍රතිසංස්කරණයට පෙර සිටියත් ප්‍රතිසංස්කරණයට පසු රු.2000 ට අඩුවෙන් ආහාර වියදම සපුරා ගන්නා කිසිදු පවුලක් නැත. වැව ප්‍රතිසංස්කරණයට පෙර 58 % පවුල් ප්‍රතිශතයක් රු.3000 ට වැඩි වියදමක් ආහාරවලට වැය කළ අතර ප්‍රතිසංස්කරණයට පසු ඒ තත්වය 88 % ක් දක්වා වැඩි වී තිබේ. ආහාරවල මිල තත්වයන් දෛනික ව ඉහළ යාම ආහාර වියදම් වැඩිවීම කෙරෙහි බලපාන සෘජු හේතුව වුවත් වැව් ප්‍රතිසංස්කරණය හේතුවෙන් ඇතිවන යහපත් බලපෑම් හේතුවෙන් ජීවන තත්වයන්ගේ ධනාත්මක වෙනස ද මේ සඳහා බලපා තිබේ. 95 % වෙසෙසියා මට්ටමක් යටතේ කරන ලද T-test පරීක්ෂාවට අනුව ද ප්‍රතිසංස්කරණයෙන් පසුව ආහාර සඳහා කරනු ලබන වියදම් තත්වයන්හි වර්ධනයක් සිදු ව ඇති බව තහවුරු වී ඇත.

**වගුව 9: කුඩා වැව් ප්‍රජාවගේ මාසික වියදම**

| මාසික වියදම් අංශ | ප්‍රතිසංස්කරණ තත්වය | ආදායම් පරාසයන්* | | | | | | | ආදායම් කාණ්ඩවල වෙසෙසි වෙනස්වීම*** |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | |
| | | ගොවීන්ගේ ප්‍රතිචාර % | | | | | | | |
| ආහාර | ප්‍ර .පෙ. | 0 | | 17 | 5 | 19 | 58 | 0 | වෙනසක් වී |
| | ප්‍ර .ප. | 0 | 0 | 0 | 2 | 10 | 88 | 0 | ඇත (P**) |
| ඇඳුම් | ප්‍ර .පෙ | 51 | 46 | 1 | 1 | 0 | 1 | 0 | වෙනසක් වී |
| | ප්‍ර .ප. | 21 | 60 | 15 | 2 | 1 | 1 | 0 | ඇත (P**) |
| කෘෂිකාර්මික කටයුතු | ප්‍ර .පෙ | 13 | 28 | 25 | 5 | 11 | 18 | 0 | වෙනසක් වී |
| | ප්‍ර .ප. | 1 | 18 | 17 | 12 | 10 | 42 | 0 | ඇත (P**) |
| අධ්‍යාපනය | ප්‍ර .පෙ | 48 | 22 | 8 | 1 | 0 | 2 | 19 | වෙනසක් වී |
| | ප්‍ර .ප. | 25 | 29 | 9 | 0 | 5 | 1 | 31 | ඇත (P**) |
| බැංකු තැන්පතු | ප්‍ර .පෙ | 21 | 15 | 6 | 0 | 1 | 2 | 55 | වෙනසක් වී |
| | ප්‍ර .ප. | 13 | 14 | 13 | 0 | 4 | 3 | 53 | ඇත (P**) |
| ගමන් වියදම් | ප්‍ර .පෙ | 78 | 17 | 3 | 1 | 1 | 0 | 0 | වෙනසක් වී |
| | ප්‍ර .ප. | 36 | 42 | 10 | 9 | 3 | 0 | 0 | ඇත (P**) |
| වෙනත් | ප්‍ර .පෙ | 19 | 45 | 4 | 26 | 4 | 1 | 0 | වෙනසක් වී |
| | ප්‍ර .ප. | 15 | 7 | 13 | 33 | 26 | 6 | 0 | ඇත (P**) |

ප්‍ර.පෙ. ප්‍රතිසංස්කරණයට පෙර          ප්‍ර. ප. ප්‍රතිසංස්කරණයට පසු

1 රු. 1000 ට අඩු 2 1000 – 1500 3 1500 – 2000 4 2000 – 2500

5 2500 – 3000 6 3000 ට වැඩි 7 මෙම අංශ මගින් ආදායම් නොලබන

** P= වෙනසක් වී ඇත **N = වෙනසක් වී නැත          *** 95 % වෙසෙසියා මට්ටම

රෙදිපිළි සඳහා කුඩා වැව් ගම් ප්‍රජාව වාර්ෂික ව කරනු ලබන වියදම් දොළහෙන් බෙදීම මගින් ඔවුන්ගේ මාසික රෙදිපිළි සඳහා වන වියදම සකස් කර ඉහත 9 වගුව මගින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව වැව් ගම්මාවාසී පවුල්වලින් 51% ක් වැව ප්‍රතිසංස්කරණයට පෙර රෙදිපිළි සඳහා වියදම් කළේ රු.1000 ට අඩු මුදලකි. නමුත් වැව් ප්‍රතිසංස්කරණයෙන් පසු 60% ක පවුල් සංඛ්‍යාවකට තම රෙදිපිළි අවශ්‍යතා සඳහා රු. 1000 - 1500 ත් අතර මුදලක් වැය කිරීමටත් 15% කට 1500 - 2000 අතර මුදලක් වැය කිරීමටත් හැකියාව ලැබී ඇත. 2% ක් රු. 2500 ට වැඩියෙන් ඒ සඳහා යොදවයි. මේ අනුව පෙනී යන්නේ ඇඳුම් පැළඳුම් සඳහා වැඩි මුදලක් වැය කිරීමට හැකි ආර්ථික වෙනසක් වැව් ගම්මාන පවුල් තුළ සිදුව ඇති බව යි. භාන්ඩ මිල ඉහළයාම ද ඇඳුම් පැළඳුම් සඳහා යන වියදම ඉහළ යෑමට හේතුවක් වුවත් පසුගිය වසර 10 තුළ දේශීය වෙළඳපොළ තුළ රෙදිපිළි මිළ බරපතළ ඉහළයාම් සිදු ව නැත. 95% වෙසෙසියා මට්ටමක් යටතේ කරන ලද T-test පරීක්ෂාවට අනුව ද ප්‍රතිසංස්කරණයෙන් පසුව ඇඳුම් පැළඳුම් සඳහා කරනු ලබන වියදම් තත්වයන්හි වර්ධනයක් සිදු ව ඇති බව තහවුරු වී ඇත.

වැව් ගම්මානවාසීහු වැඩි ප්‍රතිශතයක් ගොවීහු වෙති. එබැවින් ඔවුන්ට කිසියම් මුදලක් සිය කෘෂිකාර්මික අවශ්‍යතා වෙනුවෙන් වියදම් කිරීමට සිදුවේ. උක්ත වියදම් ආයෝජන වුවත් මෙහි දී වියදම් වශයෙන් සලකා කටයුතු කර ඇත. වැව් ප්‍රතිසංස්කරණයෙන් පසුව වැඩි වැඩියෙන් කෘෂිකාර්මික කටයුතුවල නියැලීමට අවකාශ ලැබෙන නිසා මෙම වියදම් තත්වයන් ඉහළ ගොස් ඇත. මෙහි දී මාසික වියදම් සකස් කරගෙන ඇත්තේ යලමහ දෙකන්නයේ මුළු වියදම දොළහෙන් බෙදීම කෙරෙන් වන අතර එම දත්ත ඉහත 9 වගුවට අන්තර්ගත කර තිබේ.

භාණ්ඩ මිල ඉහළ යාමේ දී කෘෂි බිම් සැකසුම් කටයුතු බීජ හා රසායනික ද්‍රව්‍ය සඳහා වැඩි වියදමක් දැරීමට සිදුවීම ස්වාභාවික ය. නමුත් කෘෂිකාර්මික කටයුතු සඳහා වැඩිම වියදමක් දැරීමට සිදුවන රසායනික පොහොර සඳහා ඉතා ඉහළ සහනාධාරයක් 2005 න් පසුව රජය මගින් ලබාදීම නිසා කෘෂිකාර්මික වියදම් දැඩිලෙස පාලනය විය. එසේ තිබියදීත් වැව් ප්‍රතිසංස්කරණයෙන් පසුව කෘෂිකාර්මික වියදම් සඳහා රු.3000 ට වැඩි මාසික වියදමක් දරන ප්‍රතිශතය 42% ක් වීමෙන් පෙනී යන්නේ කෘෂිකාර්මික කටයුතුවල යහපත් වර්ධනයක් ප්‍රතිසංස්කරණය නිසා සිදු ව ඇති බව යි. එතෙක් පුරන් ව පැවති කුඹුරු අස්වැද්දිය හැකි වීම අත් නොහැර දෙකන්න වගාකළ හැකි වීම් මීට හේතුව යි. 95% වෙසෙසියා මට්ටමක් යටතේ කරන ලද T-test පරීක්ෂාවට අනුව ද ප්‍රතිසංස්කරණයෙන් පසු ව කෘෂිකාර්මික අවශ්‍යතා සඳහා කරනු ලබන වියදම් තත්වයන්හි වර්ධනයක් සිදු ව ඇති බව තහවුරු වී ඇත.

ක්‍රි.ව. 2000 වන විට ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික තත්වයන් විමර්ශනයට ලක් කිරීමේ දී පෙනී යන්නේ අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂ ව වියලි කලාපීය දිස්ත්‍රික්කවල අධ්‍යාපනික තත්වයන් දුර්වල බව යි. හුදකලා වැව් ගම්මානවල තත්වය මීටත් වඩා

දුර්වල ය. නමුත් මෑත කාලීන ව මේ තත්වයන්වල ධනාත්මක වෙනස්කම් හඳුනා ගත හැකි ය. සංනිවේදනය දියුණු වීම ප්‍රජාව දැනුවත්වීම රජයේ වැඩි අවධානය මීට හේතුවන ප්‍රධාන බලපෑම් කාරකයෝ වෙති. කෙසේ නමුත් ග්‍රාමීය වැව් ගම්මානවල ජීවත්වන වැසියෝ අධ්‍යාපනය සඳහා කරනු ලබන වියදම් සිය මාසික ආදායමට සාපේක්ෂ වේ. ඒ අනුව වැව් ප්‍රතිසංස්කරණයට පෙර පවුල්වලින් 48% අධ්‍යාපනය සඳහා මාසික ව යෙදවූයේ රු.1000 කට අඩු මුදලක (9වගුව) ප්‍රතිසංස්කරණයෙන් පසුව 44% ක් සිය අධ්‍යාපන වියදම් වශයෙන් රු.1000 වැඩි මුදලක් වියදම් කරන අතර ඉතිරි 56% න් අඩකට වැඩි පිරිසක් අධ්‍යාපන වියදම් නැත්තෝ වෙති. 95% වෙසෙසියා මට්ටමක් යටතේ කරන ලද T-test පරීක්ෂාවට අනුව ද ප්‍රතිසංස්කරණයෙන් පසුව අධ්‍යාපන අවශ්‍යතා සඳහා කරනු ලබන වියදම් තත්වයන්හි වර්ධනයක් සිදු වී ඇති බව තහවුරු වී ඇත.

බැංකු හෝ වෙනත් මුල්‍ය ආයතනවල ඉතිරිකිරීම සඳහා මුදල් යෙදවීම ආයෝජනයක් වුවත් මෙහි දී ඒ පිළිබඳ ව කරුණු විමසා ඇත්තේ වියදම් අංශයක් ලෙස සලකා ය. කුඩා වැව් ආශ්‍රිත ව ජීවත්වන බොහෝ ගොවීන් අඩු ආදායම්ලාභීන් වන නිසා මාසික ඉතිරිකිරීම්වලට මුදල් යෙදවීමේ හැකියාවක් ඔවුන්ට නැත. ඒ බව ඉහත සඳහන් 9. වගුව විමර්ශනයෙන් වටහා ගත හැකි ය. වැව ප්‍රතිසංස්කරණයට පෙර තැන්පතු සඳහා මුදල් යෙදවීමක් නොකළ ප්‍රතිශතය 55% ක් වූ අතර වැව් ප්‍රතිසංස්කරණයෙන් පසුව ද එය 53% වශයෙන් පැවතිණ. නමුත් ප්‍රතිසංස්කරණයට පෙර රු.1500 ට වැඩි මුදලක් මාසික ව ඉතිරි කිරීම සඳහා යෙදවූ පවුල් 9% ක් සිටි අතර ප්‍රතිසංස්කරණයෙන් පසු රු.1500 ට වැඩි මුදලක් ඉතිරි කළ ප්‍රතිශතය 20% ක් දක්වා වැඩි වී තිබිණ. ඒ අනුව පෙනී යන්නේ ඔවුන්ගේ ඉතිරි කිරීමේ හැකියාව වැඩි වී ඇති බව යි. දෙකන්න වගාව මගින් හොඳ වී අස්වැන්නක් ලබා ගත හැකි වීම වී සඳහා හොඳ මිලක් ලැබීම කෙරෙන් එකවර වැඩි මුදලක් අතට ලැබීම මේ සාධනීය තත්වය සඳහා හේතු වී ඇත. 95% වෙසෙසියා මට්ටමක් යටතේ කරන ලද T-test පරීක්ෂාවට අනුව ද ප්‍රතිසංස්කරණයෙන් පසුව ඉතිරිකිරීම් අවශ්‍යතා සඳහා කරනු ලබන වියදම් තත්වයන්හි වර්ධනයක් සිදු ව ඇති බව තහවුරු වී ඇත.

ගමන් බිමන් යෑම සඳහා වැය කෙරෙන බස් ගාස්තු, මෝටර් සයිකල්, ත්‍රීවීලර් රථ හා ඒ සඳහා යොදා ගන්නා වෙනත් වාහන සඳහා වැයවන ඉන්ධන වියදම් ගමන් වියදම් වශයෙන් සලකා ඇත. වැව් ප්‍රතිසංස්කරණයට පෙර 78 % ක් පවුල් ගමන් වියදම් සඳහා මාසික ව වැය කර ඇත්තේ රු.1000 ට අඩු මුදලකි.

ප්‍රතිසංස්කරණයට පසු 42 % ක් රු. 1000 - 1500 අතර මුදලක් ද 10% ක් රු. 1500 - 2000 ත් අතර මුදලක්ද ඒ සඳහා වැය කරති. වැව් ප්‍රතිසංස්කරණයට පෙර ගමන් වියදම් සඳහා රු.2000 ට වැඩි මුදලක් වියදම් කළෝ 2% ක් වුවත් ප්‍රතිසංස්කරණයෙන්

අනතුරුව එය 12% ක් දක්වා වැඩි වී ඇත (9 වගුව). වැව් ප්‍රතිසංස්කරණයෙන් සිදුවූ ධනාත්මක වෙනස්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන් ජීවන තත්ව ඉහළයාම් හේතුවෙන් පමණක් නොව මේ කාලය තුළ සිදුවූ ඉන්ධන මිළ ඉහළයාම් ද නිසා මේ තත්වය ඇති වී තිබේ. කෙසේ වෙතත් ලැබී ඇති දත්ත 95% වෙසෙසියා මට්ටමක් යටතේ කරන ලද T-test පරීක්‍ෂාවට ලක් කිරීමෙන් අනතුරුව ලැබූ ප්‍රතිපල අනුව ද ප්‍රතිසංස්කරණයෙන් පසු ව ගමන් වියදම් සඳහා කරනු ලබන වියදම් තත්වයන්හි වර්ධනයක් සිදු ව ඇති බව තහවුරු වි ඇත.

ඉහත එකින් එක පැහැදිලි කරන ලද ප්‍රධාන අවශ්‍යතා හැරුණු කොට අනෙකුත් සියලු වුවමනාවන් සඳහා මාසික ව කරනු ලබන වියදම් වෙනත් වියදම් යටතට ඇතුළත් කොට ඇත. ඒ අනුව වැව් ප්‍රතිසංස්කරණයට පෙර 68% ක් පවුල් වෙනත් වුවමනාවන් සඳහා වැය කර ඇත්තේ රු.2000 ට අඩු මුදලකි. ප්‍රතිසංස්කරණයෙන් පසු 65% ක් පවුල් ඒ සඳහා රු.2000ට වැඩි මුදලක් යොදවා ඇත. වී ඇතුළු නිෂ්පාදන එකවර විකිණීම නිසා අතට ලැබෙන මුදල්වලින් බයිසිකල්, රූපවාහිනී යන්ත්‍ර, ශීතකරණ වැනිදෑ මිල දී ගැනීමට පෙළඹීම නිසා මේ තත්වය ඇතිවී තිබේ (9 වගුව). ලැබී ඇති දත්ත 95% වෙසෙසියා මට්ටමක් යටතේ T-test පරීක්‍ෂාවට ලක් කිරීමෙන් අනතුරුව ලැබූ ප්‍රතිඵල අනුව ද ප්‍රතිසංස්කරණයෙන් පසුව වෙනත් වියදම් සඳහා කරනු ලබන වියදම් තත්වයන්හි වර්ධනයක් සිදු ව ඇති බව තහවුරු වී ඇත.

## ජීවන තත්වයන්ගේ වෙනස්වීම් කෙරෙහි වැව් ප්‍රතිසංස්කරණයේ බලපෑම

මෙහි දී ගොවි පවුල් ජීවත්වන නිවසේ ස්වරූපය කෙරෙහි මූලික අවධානය යොමු කර ඇත. ඒ අනුව වැව් ප්‍රතිසංස්කරණයට පෙර හා පසු ව පදිංචි නිවසේ තත්වයන් හා වෙනස්වීම් නිවසේ වහල, බිත්ති හා ගෙබිම යන අංශ කෙරෙහි සැලකිල්ල යොමු කරමින් විමසා ඇත. ඒ අනුව වැව් ප්‍රතිසංස්කරණයට පෙර හා පසුව වහල සඳහා භාවිත කර ඇති ද්‍රව්‍යයන් කවරේ ද යන්න පිළිබඳ ව තොරතුරු පහත 10 වගුව මගින් ඉදිරිපත් කර ඇත. වැව් ප්‍රතිසංස්කරණයට පෙර 12% ක් පොල්අතු සෙවිළිකළ නිවාස තුළ වාසය කළ අතර ප්‍රතිසංස්කරණයට පසු එය 3% දක්වා අඩු වී තිබේ. 68% නිවාසවල වැව් ප්‍රතිසංස්කරණයට පෙර උළු සෙවිළිකර තිබූ අතර ප්‍රතිසංස්කරණයෙන් පසු එය 75% දක්වා වැඩි වී තිබේ. 10 වගුවේ අන්තර්ගත දත්ත අනුව නිවාසවල වහලේ තත්වය යම් ප්‍රගතියක් අත්කරගෙන ඇති බව පෙනුනත් ලැබී ඇති දත්ත 95% වෙසෙසියා මට්ටමක් යටතේ කල්පිත පරීක්‍ෂාවට ලක් කිරීමෙන් අනතුරුව ලැබූ ප්‍රතිඵල අනුව ප්‍රතිසංස්කරණයෙන් පසුව නිවාසවල වහලේ ගුණාත්මක තත්වයන්හි වර්ධනයක් සිදු ව නැති බව තහවුරු වී ඇත.

වගුව 10: වැව් ප්‍රතිසංස්කරණයට පෙර සහ පසු ව නිවාසවල තත්වය

| නිවාසයේ අංග | යොදාගත් ද්‍රව්‍ය | ප්‍රතිසංස්කරණයට පෙර | ප්‍රතිසංස්කරණයට පසු |
|---|---|---|---|
| | | නිවාස ප්‍රතිශතය | |
| වහල | පොල්අතු | 12 | 3 |
| | ටකරන් | 15 | 15 |
| | උළු | 68 | 75 |
| | ඇස්බැස්ටෝස් | 5 | 7 |
| | වරිච්චි | 28 | 17 |
| | ලෑලි | 0 | 0 |
| බිත්ති | ගඩොල් | 72 | 83 |
| | සිමෙන්ති ගල් | 0 | 0 |
| | ගොම මැටි | 41 | 23 |
| | සිමෙන්ති | 58 | 76 |
| ගෙබිම | ටෙරාසෝ | 0 | 0 |
| | ටයිල් | 1 | 1 |

වැව් ප්‍රතිසංස්කරණයට පෙර 28% නිවාසවල බිත්ති වරිච්චි බිත්ති ය. නමුත් ප්‍රතිසංස්කරණයෙන් පසුව එය 17% ක් දක්වා අඩු වී තිබේ. 72% ක් වශයෙන් තිබූ ගඩොළුවලින් තැනූ නිවාස වැව් ප්‍රතිසංස්කරණයෙන් පසු 83% දක්වා වැඩි වී තිබේ (10 වගුව) කෙසේ වෙතත් නිවාසවල බිත්තිවල තත්වයේ ගුණාත්මක වෙනසක් වැව් ප්‍රතිසංස්කරණයෙන් පසුව සිදුවී නොමැති බව අදාළ දත්ත අනුසාරයෙන් 95% වෙසෙසියා මට්ටමක් යටතේ සිදු කරනු ලැබූ කල්පිත පරීක්ෂාවට අනතුරුව ලැබූ ප්‍රතිඵල අනුව තහවුරු වී ඇත.

වැව් ප්‍රතිසංස්කරණයට පෙර පැවති නිවාසවලින් 41% ම ගෙබිමට යොදා තිබුණේ ගොම මැටි ය. නමුත් ප්‍රතිසංස්කරණයෙන් පසු ව ගොම මැටි යෙදූ නිවාස සංඛ්‍යාව 23% දකවා අඩු වී තිබිණ. 58% ක්ව තිබූ සිමෙන්තිවලින් ගෙබිම සකස්කළ නිවාස සංඛ්‍යාව ප්‍රතිසංස්කරණයෙන් පසුව 76% ක් දක්වා වැඩි වී තිබිණ (10 වගුව).

නමුත් නිවාසවල ගෙබිමෙහි ගුණාත්මක වෙනසක් වැව් ප්‍රතිසංස්කරණයෙන් පසුව සිදු වී නොමැති බව අදාළ දත්ත අනුසාරයෙන් 95% වෙසෙසියා මට්ටමක් යටතේ සිදු කරනු ලැබූ කල්පිත පරීක්ෂාවට අනතුරුව ලැබූ ප්‍රතිඵල අනුව තහවුරු වී ඇත.

ඉහත පැහැදිලි කළ ආකාරයට වැව් ප්‍රතිසංස්කරණයෙන් පසුව නිවාසවල වහල බිත්ති හා ගෙබිමෙහි තත්වයන්හි ගුණාත්මක වෙනසක් දක්නට නොලැබුණත් වැව් ප්‍රතිසංස්කරණයෙන් පසු නිවාසවල ගෙබිමෙහි ප්‍රමාණයේ වර්ධනයක් සිදු වී ඇති බව පහත 11 වගුව විමර්ශනයෙන් අවබෝධ කරගත හැකි ය. වැව් ප්‍රතිසංස්කරණයට පෙර වර්ග අඩි 1000 ට වැඩි නිවාස ප්‍රතිශතය 27% ක් වූ අතර වැව් ප්‍රතිසංස්කරණයෙන් පසුව වර්ග අඩි 1000 ට වැඩි නිවාස ප්‍රතිශතය 31 % දක්වා වැඩි වී ඇත. අදාළ දත්ත අනුසාරයෙන් 95% වෙසෙසියා මට්ටමක් යටතේ සිදු කරනු ලැබූ කල්පිත පරීක්ෂාවට අනතුරුව ලැබූ ප්‍රතිඵල අනුව ද මේ බව තහවුරු වී ඇත.

**වගුව 11: නිවාසවල වර්ග ප්‍රමාණය**

| වර්ග ප්‍රමාණය | ප්‍රතිසංස්කරණයට පෙර | | ප්‍රතිසංස්කරණයට පසු | |
|---|---|---|---|---|
| | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
| වර්ග අඩි <500 | 27 | 18 | 20 | 13 |
| වර්ග අඩි 500 1000 | 82 | 54 | 84 | 56 |
| වර්ග අඩි 1000 1500 | 38 | 25 | 42 | 28 |
| වර්ග අඩි 1500 < | 3 | 2 | 4 | 3 |
| එකතුව | 150 | 100 | 150 | 100 |

වැව් ප්‍රතිසංස්කරණය හේතුවෙන් වැවේ ජලධාරිතාව වැඩි වී ජලය කාර්යක්‍ෂම ලෙස වගා බිම්වලට යොමුකළ හැකිවීම ජලය අපතේ නොයෑම වැනි වාසි සහගත තත්වයන් ඇතිවේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් දෙකන්නය ම වී වගා කළ හැකි වී ඇත. එමෙන් ම ගත වූ කාලය තුළ වී සඳහා හොඳ මිල තත්වයක් ද තිබී ඇත. වී එකවර විකිණීම මගින් විශාල මුදලක් එකවර අතට එන නිසා තම නිවාසවල යම්යම් වෙනස්කම් කිරීමට ගොවියාට හැකියාව ලැබී ඇත. ඔවුන් බොහො දුරට උත්සාහ කර අත්තේ එතෙක් තිබූ කුඩා නිවස වෙනුවට තරමක් විශාල නිවසක් ගොඩනගා ගැනීමට උත්සාහ කිරිම යි. ගල්ගමුව ප්‍රදේශයේ ගඩොළු මිල පහළ අගයක් ගැනීමත් තමන්ට ම ගඩොළු නිෂ්පාදනය කර ගත හැකි වීමත් නිසා පෙර පැවති කුඩා නිවාස ද බොහෝවිට ගඩොළින් ම තැනූ නිවාස විය. පසුව තැනූ නිවස ප්‍රමාණාත්මක ව වෙනස් වුවත් ගුණාත්මක ව වෙනස් නොවූයේ ඒ හේතුව නිසා ය.

වැව් ප්‍රතිසංස්කරණයට පෙර 9% ක් වැව් ගම්මානවාසීන් තම වැසිකිළි අවශ්‍යතා ස්ථිර නොවූ වළ වැසිකිළි මාර්ගයෙන් සපුරා ගත්තත් ප්‍රතිසංස්කරණවලින් පසුව තාවකාලික වළ වැසිකිළි භාවිතයක් තිබුණේ නැත. නමුත් ලැබී ඇති දත්ත අන්තර්ගත 12 වගු අනුවත් එම දත්ත අනුසාරයෙන් කරනු ලැබූ 95% වෙසෙසියා මට්ටමක් යටතේ වූ කල්පිත පරීක්‍ෂාවට අනුවත් තහවුරු වී ඇත්තේ වැසිකිළි භාවිතයේ සමස්තය තුළ ගුණාත්මක වෙනසක් සිදු ව නැති බව යි.

**වගුව 12: වැසිකිළි භාවිතයේ වෙනස්වීම්**

| වැසිකිළි වර්ගය | ප්‍රතිසංස්කරණයට පෙර | | ප්‍රතිසංස්කරණයට පසු | |
|---|---|---|---|---|
| | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය | අධ්‍යයනයට භාජනය වූ ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 1 තාවකාලික වළ | 13 | 9 | 0 | 0 |
| 2 ස්ථිර වළ | 79 | 52 | 31 | 21 |
| 3 ජල මුද්‍රිත නිවස තුළ | 58 | 39 | 119 | 79 |
| 4 ජල මුද්‍රිත නිවසින් පිටත | 0 | 0 | 0 | 0 |
| 5 පොදු වැසිකිළිය | 0 | 0 | 0 | 0 |
| 6 කැළෑව | 0 | 0 | 0 | 0 |
| 7 වැව්තාවුල්ල | 0 | 0 | 0 | 0 |
| එකතුව | 150 | 100 | 150 | 100 |

## කුඩා වැව් විවිධ කාර්යයන් සඳහා භාවිත කිරීමේ තීව්‍රතාව

වී වගාවට ජලය ලබා ගැනීම පමණක් නොව කුඩා වැව්වල ප්‍රයෝජන රාශියක් තිබේ. වැව් ප්‍රතිසංස්කරණයට පෙර හා පසුව එක් එක් කාර්යයන් සඳහා වැව ප්‍රයෝජනයට ගත හැකිවීමේ තීව්‍රතාව මැනීම සඳහා PRA අවයවයක් (Tool) වන න්‍යාස තරා (Metrix ranking ) ක්‍රමය භාවිතයෙන් කරන ලද අධ්‍යයනයක් පහත දැක්වේ. ඒ අනුව වැව වඩාත් කාර්යක්ෂම සහ පලදායී ලෙස යොදාගත හැකි කාර්යයන් ප්‍රමුඛතාව අනුව පෙළගස්වා ඇත (13 සහ 14 වගු).

**වගුව13: භාවිතා කිරීමේ තීව්‍රතාව :ප්‍රතිසංස්කරණයට පෙර***

| වැව භාවිතා කිරීම / වැවේ නම | වී වගාව | කාලීන බෝග වගාව | බහු වාර්ෂික බෝග වගාව | ධීවර කටයුතු | මල් වගා කිරීම | නෙළුම් අල විකිණීම | ස්නානය | පානීය ජලය | වෙනත් ගෘහස්ථ කටයුතු | භූගත ජලය සංවර්ධනය | විනෝද කටයුතු | සතුන් නෑවීම | වනය පෝෂණය | මුළු ලකුණු | වැව සඳහා තරාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පහල පුලංවිය වැව | 4 | 3 | 3 | 3 | 4 | 4 | 4 | 1 | 4 | 3 | 3 | 3 | 4 | 43 | 2 |
| ඉහලගම වැව | 1 | 2 | 2 | 1 | 2 | 3 | 1 | 1 | 2 | 3 | 1 | 2 | 2 | 23 | 12 |
| පහල කෝන් වැව | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 2 | 3 | 3 | 2 | 3 | 2 | 36 | 7 |
| ඉහල පළුකැන්දෑව වැව | 2 | 3 | 2 | 2 | 3 | 3 | 2 | 1 | 3 | 2 | 2 | 3 | 3 | 31 | 11 |
| මාවිටුකුලම වැව | 3 | 4 | 3 | 2 | 3 | 4 | 2 | 1 | 3 | 2 | 3 | 3 | 2 | 35 | 8 |
| දිවුල්ලෑව වැව | 3 | 3 | 3 | 2 | 4 | 3 | 3 | 1 | 4 | 2 | 4 | 3 | 4 | 39 | 5 |
| කුරුන්දන්කුලම වැව | 2 | 3 | 2 | 2 | 3 | 3 | 3 | 1 | 3 | 2 | 3 | 3 | 3 | 33 | 10 |
| මොන්නන්කුලම වැව | 4 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 1 | 4 | 3 | 4 | 3 | 3 | 40 | 4 |
| පහල පළුකැන්දෑව වැව | 3 | 3 | 3 | 2 | 3 | 4 | 3 | 1 | 3 | 2 | 2 | 3 | 2 | 34 | 9 |
| බුල්නෑව වැව | 3 | 3 | 4 | 3 | 3 | 3 | 3 | 2 | 3 | 3 | 3 | 3 | 2 | 38 | 6 |
| මැදවච්චිය වැව | 4 | 4 | 3 | 4 | 2 | 3 | 4 | 2 | 4 | 3 | 4 | 3 | 3 | 43 | 3 |
| මහගල්කඩවල වැව | 4 | 4 | 4 | 3 | 3 | 3 | 4 | 2 | 4 | 3 | 4 | 3 | 4 | 45 | 1 |
| මුළු ලකුණු | 36 | 38 | 35 | 30 | 35 | 39 | 35 | 16 | 40 | 31 | 35 | 35 | 34 | 440 | |
| ක්‍රියාකාරකම සඳහා තරාව | 4 | 3 | 5 | 12 | 6 | 2 | 7 | 13 | 1 | 11 | 8 | 9 | 10 | | |

මූලය -: PRA සමීක්ෂණය 2007

තරාව

5 ඉතා ඉහළයි 4 ඉහළයි 3 සාමාන්‍යයි 2 දුර්වලයි 1 ඉතා දුර්වලයි

13 වගු මගින් විශ්ලේෂණය කර ඇත්තේ වැව් ප්‍රතිසංස්කරණයට පෙර එක් එක් කාර්යයන් සඳහා වැව භාවිතයට ගත හැකි ව තිබූ තීව්‍රතාව යි. ඒ අනුව අංක 1 හිමි වී ඇත්තේ ගෘහස්ථ අවශ්‍යතා සඳහා භාවිතයට ගැනීම යි. අංක දෙක නෙළුම් අල ගලවා ගැනීමට හිමි ව ඇත. අංක 3 වාර්ෂික බෝග වගාව සඳහා ජලය සැපයීමට හිමි ව ඇත. වී වගාවට ජලය සැපයීමට හිමි ව ඇත්තේ හතරවන ස්ථානය යි. ධීවර කටයුතු සඳහා හිමි ව ඇත්තේ දොළොස් වන ස්ථානය යි. වැව්වල ඵලදායීතාව සැලකිල්ලට ගත් විට ප්‍රතිසංස්කරණයට පෙර වඩාත් ප්‍රයෝජනවත් වැව වී තිබුණේ මහගල්කඩවල වැව යි. දෙවන ස්ථානය පහළ පූලංචිය වැව විසින් හිමිකර ගෙන තිබුණි. මැදවච්චිය වැවට තුන්වන ස්ථානය හිමිවිය. මැදවච්චිය වැව හා පහල පූලංචිය වැව කුරුණෑගල අනුරාධපුර ප්‍රධාන මාර්ගයට ආසන්න ව තිබීම නිසා වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීමේ හැකියාව වැඩිවීම ප්‍රමුඛතාව ලැබීමට හේතුව විය. නමුත් කුඩා වැවක මුඛ්‍ය පරමාර්ථය වන වී වගාවට ජලය සැපයීම වැව් ප්‍රතිසංස්කරණයට පෙර සාර්ථක ව සිදු ව නැති බව මේ අනුව පැහැදිලි වේ.

වගුව14: භාවිතා කිරීමේ තීව්‍රතාව :ප්‍රතිසංස්කරණයට පසු*

| වැව භාවිතා කිරීම / වැවේ නම | වී වගාව | කාලීන බෝග වගාව | බහු වාර්ෂික බෝග වගාව | ධීවර කටයුතු | මල් විකිණීම | නෙළුම් අල විකිණීම | ස්නානය | පානීය ජලය | වෙනත් ගෘහස්ථ කටයුතු | භූගත ජලය සංවර්ධනය | විනෝද කටයුතු | සතුන් නෑවීම | වනය පෝෂීම | මුළු ලකුණු | වැඩි සැකා තරාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පහල පූලංචිය වැව | 4 | 4 | 3 | 3 | 3 | 3 | 4 | 1 | 4 | 3 | 4 | 4 | 4 | 44 | 3 |
| ඉහලගම් වැව | 2 | 2 | 2 | 2 | 3 | 2 | 2 | 1 | 3 | 3 | 2 | 2 | 2 | 28 | 12 |
| පහල කෝන් වැව | 4 | 3 | 4 | 3 | 3 | 3 | 4 | 1 | 4 | 3 | 4 | 3 | 3 | 42 | 5 |
| ඉහල පළුකැන්දෑව වැව | 3 | 3 | 3 | 3 | 4 | 4 | 3 | 2 | 3 | 3 | 3 | 3 | 4 | 41 | 6 |
| ඔට්ටුකුලම වැව | 3 | 3 | 3 | 3 | 4 | 4 | 3 | 1 | 3 | 3 | 4 | 3 | 3 | 40 | 9 |
| දිවුල්ලෑව වැව | 4 | 3 | 4 | 3 | 3 | 3 | 4 | 2 | 4 | 3 | 4 | 3 | 4 | 44 | 4 |
| කුරුන්දන්කුලම වැව | 3 | 3 | 3 | 3 | 3 | 3 | 2 | 2 | 3 | 3 | 3 | 3 | 3 | 37 | 11 |
| මොත්තන්කුලම වැව | 4 | 4 | 3 | 3 | 2 | 2 | 4 | 2 | 3 | 3 | 4 | 3 | 3 | 40 | 10 |
| පහල පළුකැන්දෑව වැව | 3 | 3 | 3 | 3 | 4 | 4 | 3 | 2 | 3 | 3 | 3 | 3 | 4 | 41 | 7 |
| බුල්නෑව වැව | 4 | 4 | 4 | 3 | 3 | 3 | 3 | 1 | 3 | 3 | 4 | 3 | 3 | 41 | 8 |
| මැදවච්චිය වැව | 5 | 4 | 4 | 5 | 2 | 2 | 5 | 2 | 5 | 4 | 5 | 3 | 3 | 49 | 1 |
| මහගල්කඩවල වැව | 5 | 4 | 4 | 4 | 2 | 2 | 5 | 2 | 5 | 4 | 5 | 3 | 3 | 48 | 2 |
| මුළු ලකුණු | 44 | 40 | 40 | 38 | 36 | 35 | 42 | 19 | 43 | 38 | 45 | 36 | 39 | 495 | |
| ක්‍රියාකාරකම සඳහා තරාව | 2 | 5 | 6 | 8 | 10 | 12 | 4 | 13 | 3 | 9 | 1 | 11 | 7 | | |

මූලය -: PRA සමීක්ෂණය 2007

තරාව

5 ඉතා ඉහළයි 4 ඉහළයි 3 සාමාන්‍යයයි 2 දුර්වලයි 1 ඉතා දුර්වලයි

වැව් ප්‍රතිසංස්කරණයෙන් පසු තත්වයන් විශ්ලේෂණය කිරීමේ දී බොහෝ තත්වයන් වෙනස් වී ඇති බව 14 වගුව ආශ්‍රයෙන් අවබෝධ කරගත හැකිය. ඒ අනුව වැව් භාවිතා කිරීමට හැකි වීමේ ශක්‍යතාව අනුව ප්‍රමුඛතාව ලැබී ඇත්තේ සංචාරක කටයුතු සඳහා ය. දෙවන ස්ථානය වී වගාවට ජල සම්පාදනය කිරීම හිමිකරගෙන තිබේ. තුන්වන ස්ථානය ගෘහස්ථ කටයුතු සඳහාත් අටවන ස්ථානය ධීවර කටයුතු සඳහාත් හිමි ව ඇත. වැව් ප්‍රතිසංස්කරණයට පෙර **තරා** අගයන්ගේ එකතුව 440 වන අතර වැව් ප්‍රතිසංස්කරණයෙන් පසුව උක්ත අගය 495 ක් දක්වා වැඩි වී ඇත. උක්ත විශ්ලේෂණයන් අනුව වැව් ප්‍රතිසංස්කරණයෙන් පසු ව ආර්ථික අවශ්‍යතාවන් සඳහා වැව භාවිතයට ගැනීමේ ශක්‍යතාවෙහි ධනාත්මක වෙනසක් සිදු වී ඇති බව තහවුරු කළ හැකි ය.

## කුඩා වැව් ආශ්‍රිත ව සිදුවන වෙනත් කර්මාන්ත හා ආර්ථික කටයුතු

ඉහත අවස්ථා කිපයක දී පැහැදිලි කරඇති පරිදි වැව ආශ්‍රිත ආර්ථික කටයුතුවලට අමතර ව වෙනත් ආර්ථික කයයුතු කීපයක් වැව ආශ්‍රිත ව සිදුවේ. ප්‍රශ්නාවලි සමීක්ෂණයට ඌන පූරණයක් වශයෙන් PRA ක්‍රමවේදයන් හා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා මගින් ඒ පිළිබඳ ව කරුණු අනාවරණය කර ඇත. ගඩොළු කැපීම හා සත්ව පාලනය (විශේෂයෙන් ගව පාලනය) මේ අතර ප්‍රධාන වේ. ගඩොළු කැපීමේ කර්මාන්තය සඳහා ගල්ගමුව ප්‍රදේශය නම්දරා තිබුණත් සසම්භාවී ලෙස තෝරාගත නියැදියේ ගඩොළු කපන්නන් නොසිටි නිසා තොරතුරු අනාවරණය සඳහා විකල්ප ක්‍රම භාවිත කර ඇත. අත්හැර දමන ලද කුඩා වැව් ආශ්‍රිත ව ගඩොළු කැපීම වැඩි වශයෙන් සිදුවේ. ප්‍රතිසංස්කරණය සඳහා යොදාගත් අතැම් වැව්වල (උදා මොන්නන්කුලම හා ඔට්ටුකුලම වැව) තාවලුළුවල ගඩොළු කැපීම සිදුකර තිබුණත් ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව ගඩොළු කැපීම අත්හිටුවා ඇත. ගොවි සංවිධාන මගින් විරුද්ධ වීම, වී වගාවට යොමුවීම හා රජය මගින් තහනම් කිරීම ඊට හේතු ලෙස දැක්විය හැකි ය.

සත්ව පාලනය මහා පරිමාණයෙක් දක්නට නැතත් ඇතැම් නිවසක කිරි ගවයෙකු හෝ කීපදෙනෙකු දක්නට හැකි ය. එමෙන්ම ඇතැම් නිවසක මී හරක් සිටිති. එවුන්ට තණ කැවීම සඳහා වැව් තාවලු භාවිතයට ගන්නේ කුඹුරු වගා කර ඇති කාලසීමාවල දී ය. රැස්කර ගත් පිදුරු හා පුන්නක්කු ද ආහාර වශයෙන් ලබාදීම සිදුකෙරේ. වැව් ප්‍රතිසංස්කරණය ගඩොළු කර්මාන්තයට යම් බලපෑමක් වී ඇතත් සත්ව පාලනය කෙරෙහි බලපෑමක් සිදුකර ඇතැයි ගොවීන්ගේ අදහස් කෙරෙන් අනාවරණය නොවේ.

## නිගමන

වැව ප්‍රතිසංස්කරණයෙන් පසු වගා ප්‍රබෝධයක් සිදු වී ඇත. පුරන් කුඹුරු අස්වැද්දීමට ගොවීහු පෙළඹී ඇති අතර දෙකන්න වගාව කිරීමට දැඩි උත්සාහයක නියැලෙති. පොහොර සහනාධාරය ලබා දීම හා වී සඳහා ඉහළ මිලක් ලැබීම වී වගාව කෙරෙහි ගොවීන්ගේ ආකර්ෂණය ඉහළ දමා ඇති අතර එය ප්‍රායෝගික ව සාර්ථක වීම

කෙරෙහි බලපා ඇත්තේ වැව් ප්‍රතිසංස්කරණය යි. වී වගාව මගින් ආහාර සුරක්ෂිතතාව ඇතිවීමෙන් අනෙකුත් අවශ්‍යතා සපුරා ගැනීමට වෙනත් ගොඩ බෝග වගාවට ද පෙළඹී ඇත. ගොවි සංවිධාන ශක්තිමත් ලෙස ක්‍රියාත්මක වේ. වැව්වලට මිරිදිය මසුන් මුදා හැරීම මගින් ධීවර කර්මාන්තයේ සංවර්ධයක් ඇති කිරීමට පියවර ගෙන ඇත. කුඩා වැව්වල ධීවර සම්පත් ප්‍රවර්ධනය කිරීමේ විභවතාවක් ඇත. එමෙන් ම එමගින් ග්‍රාමීය ව පවතින පෝෂණ ඌනතාවන්ට හොඳ විසඳුමක් ලබා දිය හැකි ය. නමුත් බෞද්ධ සාර්ධර්ම හා සංස්කෘතික ගති ලක්ෂණ මගින් මෙහෙයවනු ලබන වැව්වාසී ප්‍රජාව ඒ කෙරෙහි යොමු වී ඇත්තේ ඉතා අඩුවෙනි. එමෙන් ම ධීවර සම්පතින් ඍජු ව ප්‍රතිලාභ ලබා ගැනීම කෙරෙහි ඔවුන් යොමු කරවීම ද අසීරු කරුණකි.

අවශේෂ ධනයක් ගමට ගලා ඒම කෙරෙන් නිවාස සංවර්ධනයක් සිදු වී ඇත. වරිච්චි නිවාස ප්‍රතිශතය අඩු වී තිබේ. සාපේක්ෂ ව නිවාසවල වර්ග ප්‍රමාණය වැඩි වී තිබේ. යටිතල සහසුකම් සංවර්ධනයක් ද අධ්‍යාපන ප්‍රබෝධයක ද සිදු වී ඇත. වියදම් රටාවේ ද ධනාත්මක වෙනසක් ඇති වී තිබේ. ආයෝජනය සඳහා සහ අධ්‍යාපනය සඳහා මුදල් යෙදවීමේ ප්‍රවණතාවක් දක්නට ඇත. ආර්ථික කටයුතු සඳහා කුඩා ළමුන් යොදා ගැනීම සීමා වී ඇති අතර ඔවුන් අධ්‍යාපනය කෙරෙහි වැඩි වැඩියෙන් නැඹුරු කරවීමේ ප්‍රවණතාවක් හඳුනා ගත හැකි ය. සෑම අත්‍යවශ්‍ය වියදම් අංශයක ම සාපේක්ෂ වර්ධනයක් දක්නට ඇත. වැසිකිළි සහසුකම්වල ගුණාත්මක සංවර්ධයක් සිදු වී තිබේ. වැව විවිධ කාර්යයන් සඳහා යොදා ගැනීමේ හැකියා තීව්‍රතාව මැන බැලීමේ දී තහවුරු වන්නේ ප්‍රතිසංස්කරණයෙන් පසු ව භාවිත හැකියා තීව්‍රතාව ඉහළ ගොස් ඇති බව යි. වැව් ප්‍රතිසංස්කරණයේ දී වැඩි වශයෙන් භාවිත කර ඇත්තේ ජනප්‍රිය ක්‍රමය වන වැව හෑරීම යි. වැව හෑරීම හා පස් ඉවත් කර ගැඹුරු කිරීම අවශ්‍ය ප්‍රතිසංස්කරණයන් වුවත් ඇතැම් වැව්වල මූලික ප්‍රතිසංස්කරණ අවශ්‍යතාව අනෙකකි. උදාහරණයක් වශයෙන් මදවච්චිය වැව් ප්‍රජාවට අවශ්‍ය වී ඇත්තේ තව දුරටත් වැව හෑරීම නොව වැව් ඉහත්තාව සුරක්ෂිතව පවත්වා ගැනීම ය. එමෙන් ම දකුණු කෝන්වැව වැව් ප්‍රජාවට වඩා අවශ්‍ය වී ඇත්තේ ඇල වේලි පිළිසකර කිරීම යි. මෙම උවමනාවන් ක්ෂණික ව හඳුනාගත නොහැකි ය.ඒ සඳහා ක්‍රමවේදයන් හඳුනාගෙන මෙම අධ්‍යයනයේ දී භාවිත කර ඇත.

කුඩා වැව් තිබෙන්නේ හුදෙක් වී වගාව සඳහා ජල සම්පාදනයට පමණක් ය යන දුර්මතය තවමත් වැව් ප්‍රජාව වෙතින් මුළුමනින් ම බැහැර වී නැත. පෝෂිත ප්‍රදේශයේ ඉඩම් හිමි ගොවීන් ඇතැමෙක් වැව හිමි තමන්ට පමණක් බව සිතා සිටීමත් කුඹුරු අහිමි වැව් ප්‍රජාව අතර ඇතැමෙක් වැව පිළිබඳ ව තමන්ට වගකීමක් නැතැයි සිතීමත් කුඩා වැවේ තිරසාර පැවැත්ම කෙරෙහි එකසේ හානිකර වී ඇත. වී වගාවට ජලය සම්පාදය කිරීමට අමතර ව පාරිසරික ආර්ථික හා සමාජීය සේවාවන් රාශියක් වැවෙන් ඉටුවේ.

## පරිශීලිත මූලාශ්‍රයෝ


අවුසදහාමි උදුල බණ්ඩාර (1999) වැව, හිඟුරක්ගොඩ, සිරි ප්‍රින්ටර්ස්.

Farmer, B.H. (1957) Pioneer Peasant Colonization in Ceylon, Oxford.

Panabocke C.R. (2000) "The Nature and properties of small tanks system of the dry Zone and their sustainable production theresholds" in H.P.M Gunadasa (ed.). Food Security and small tank systems in Sri Lanka.

Panabokke, C.R. Sakthiwadivel , R. and Weerasinghe A.D. (2002) Small Tanks in Sri Lanka, Evaluation, Present Status and Issues, International Water Management Institute, Colombo.

Somasiri, S. (1979) Village Tank as an Agricultural resources in the Dry Zone of Sri Lanka. Tropical Agriculturist, v. 135, pp. 33 – 46.

Tennakoon, M.U.A. (2002) Small Tanks Cascades as Development units in the Dry Zone in Dry Zones, Economic Review, pp. 21-29.

Tennakoon, M.U.A. (2004) Tank are not Mono Functional they are multifunctional, Proceedings of a Symposium, Hector Kobbekaduwa Agrarian Research & traning Institute ,Colombo.